මානවශාස්ත්‍ර අධ්‍යයන, *1999 (1)*, පිටු *67-78.*

රජරැටියාට පෙම් බැන්ද පිළේ පැදුරේ අත්තප්පා
(ස්වර්ණ ශ්‍රී බණ්ඩාරගේ මාධ්‍ය මෙහෙවර පිළිබඳ සහෘද සංවාදය)

සේන නානායක්කාර

මට මතක හැටියට ඒ 1983 අවුරුද්ද! දෙමුල්ල ඉරුණු පන්මල්ලක් එල්ලාගත් අවුරුදු අසූවක පමණ වේ යැයි සිතිය හැකි ගැමියෙක් රජරට සේවා කාර්යාලයේ ප්‍රධාන දොරටුව අබියසට පැමිණ සැහෙන වෙලාවකි.

"මොකද ලොකු උන්නැහේ...?"

ආරක්ෂක නිලධාරියෙක් ඔහු අමතයි.

"මේ... අපේ අත්තප්පා බැහැදකින්ඩ කියල"

ඔහුගේ පිළිතුරෙන් නිලධාරියා විමතියට පත්විය. ඉහතිකට පැහුණු මේ මහල්ලා උමතුවෙන්දෝ" යි නිලධාරියාට සිතෙන්නට ඇත. නිලධාරියාගේ තේජාන්විත හරස් ප්‍රශ්නත් අමුත්තාගේ බයාදු කට උත්තරත් අතර පරස්පරය ටික වෙලාවක් යනතුරු පැවතිණි. මෙතෙක් වෙලා කාර්යාලයේ ඉහළ මාළයේ සිට මේ සියල්ල දෙස අපැහැදිලිව බලා සිටි අයෙක්, අමුත්තා තමා වෙත එවන්නැයි ආරක්ෂක නිලධරයාට දන්විය. අමුත්තා සැනෙකින් ඉහළ මාළයට යැවිණි.

කාර්යාල කාමරයේ අසුන්ගෙන සිටි, මහත දෙහෙතින් අඩු නැති දැවැන්ත මිනිසා දුටු අමුත්තා, කරේ තිබුණු කොටු වැටුණු කිළිටි තුවා කැබැල්ල දෑතට ගුලි කරගෙන තවතවත් බයාදු විය. දැවැන්ත මිනිසා කිසිත් ගණනකට නොගෙන අමුත්තාට අසුන් පැනවූයේ, එතෙක් ඔහු සිටි අසුනින් නැගී සිටිමිනි.

"ඉතින්...? මොකෝ මේ පැත්තේ ?"

"අපේ පිලේ පැදුරේ අත්තප්..."

අමුත්තාට කියන්නට ලැබුනේ එපමණ කි. දවැන්ත මිනිසා කට කොණකින් සිනාසී මෙසේ කීය.

"මම තමයි අත්තප්ප..."

"සුවන්නසිරි බණ්ඩාරෙද..."?

"ඔව් ..." පිළිතුරු ලැබිණි. අමුත්තා මහ හඬින් සිනාසෙන්නට විය. ඔහු පස්වනක් ප්‍රීතියෙන් පිනා ගොස් ය

"බොලේ.... උඹද ඒකා ...? මට උඹේ කටේ සද්දේ නිනව් නැතුවා නොවැ. මං මේ උඹැහැ මුලිච්චි වෙන්ඩ එන්නේ දෙතුන් දෙහක ඉඳං..."

ඔහු බුලත් අතක් සහ හොඳින් ඉදුණු පැණිකොමඩු ගෙඩියක් මල්ලෙන් එලියට ගෙන මේසය උඩ තබමින් කියාගෙන කියාගෙන යයි.

"අපේ ගමේ එකාල උඹැහැට වහ වැටිල බොලේ. මං මේ තකහතියෙන් උඹැහැ මුලිච්චිවෙන්ඩ ආවෙ අපේ ඒකාලා ගැනත් පිලේ පැදුරෙං දොඩන්ඩ කියන්ඩ..."

ස්වර්ණ ශ්‍රී බණ්ඩාර...! කලා ක්ෂේත්‍රයේ විවිධ මංපෙත් ඔස්සේ සිය ප්‍රතිභාව දල්වා ලූ ඔහු සාර්ථක සන්නිවේදකයෙක් වන්නේ කෙසේදයි විමසීම, මෙම ලිපියෙහි අපේක්ෂිතාර්ථය වෙයි. විෂයානුකූල අවබෝධයෙන් හා ස්වකීය ජීවිත පරිඥානයෙන් ඔහු එක් තැන් කළ දේ වඩාත් බබලන්නට වුයේ, දෛනික චර්යාවේ දී ඔහු විසින් පසක් කරන ලද මානව හිතවාදී මානුෂීය ගුණාංගයන්ගේ මහිමයෙන් ම යැයි මම විශ්වාස කරමි. "එබඳු මානවීය ගුණයන්ගෙන් පිරිපුන් සුපහන් සිත් ඇති නිර්භීත නිර්මාණ ශිල්පීහු නිබඳ විශිෂ්ටත්වයට පත්වෙති"යි සාහිත්‍ය කලාදියෙහි පුරෝගාමී රෝම පඬිවර හොරස්[1] ප්‍රකාශ කරයි. එකී දෘෂ්ටිමය ප්‍රතිෂ්ටාවෙහි සිට අපි ඔහු විමසමු.

ස්වර්ණ ශ්‍රී, උසස් යැයි සම්මත ප්‍රභූන්ගේ හෝ දනුම් තේරුම් ඇති නැති නාගරිකයින්ගේ පමණක් නොවේ, ගමේ ගොඩේ පීඩාවට පත්වුවන්ගේත්, දුප්පතුන්ගේත් හද බැඳි මිතුරෙක් ම විය. පටු පක්ෂ දේශපාලන වෛරසයෙන් ගිලන් වූ ලාංකීය සමාජය තුළ ඇත්ත යුත්ත මනාකොට අවබෝධ කොටගත් සැබෑ මාධ්‍යවේදියෙක් විය. එනිසා ම ඔහුට වෙසෙස් වන සමාජ තරාතිරමක් හෝ උස්මිටි භේදයක් නොවී ය. ජාති, ආගම්, කුලමල හෝ දේශපාලන වර්ණ භේදයක් ඔහුට නොවිණි. රජරට පොදු ජනතාවගේ සිනහව හා කඳුළ මුසුකොටගත් පත්තම් රටා "පිලේ පැදුරේ" මැවුණේ එබැවිනි.

ආණ්ඩුවේ යකඩ කටින් ඇත්ත පමණක් ම කීම විටෙක දී තරමක් දුෂ්කර වෙයි. නමුත්, ඔහු පැත්තක් ගියත් ඇත්ත කියන්නට බය නැති මිනිසෙක් විය. කට කැවත් ඇත්ත කියන්නයි, ඇත්ත කියා බිම ඉඳගන්නයි ඔහු කිසිවිටෙක පසුබට වුයේ නැත.

"ඌට බයත් නෑ. මූට බයත් නෑ
කාට බයත් නෑ. මමයි මගෙ රජා..."

ඔහුගේ පොත් ගුලේත්, කාර්යාලයේත් කාහට වුව ද පැහැදිලිව පෙනෙන සේ මෙකී උද්ධෘතය ප්‍රදර්ශනය කොට තිබිණි. පැසසිය යුතු තැන වගේ ම, වැනසිය යුතු තැන ද ඔහු හොඳින් හඳුනාගෙන තිබිණි. අද්‍යතන රාජ්‍ය මාධ්‍ය ආයතනයන් හි ප්‍රශස්ති සම්පාදකයන්ව දීනව සිය ස්වාධීනත්වය පාවාදෙමින් තාවකාලික සුඛ විහරණය පරිභෝජනය කරන ඊනියා මාධ්‍යකරුවනට ඔහුගෙන් උගත හැකි පාඩම් අපමණ ය. ඔහු ලියූ කියූ බොහෝ දේ ජනතාවගේ හිත සුව පිණිස මිස ඔහුගේ වාසිය සඳහා නොවීම එහි සුවිශේෂත්වය යි.

ඔහු කළ කී දෙයින් කෝපාවිෂ්ට වූ රජමැතිඳුන් පවා ඇටිකෙහෙල් ගිල්ලවුන් ලෙස මුවින් නොබැණ සිටින්නට තරම් ඥාණාන්විත වූයේ ඔහු කෙරෙන් රජරට පොදු ජනතාව තුළ එවකට ගොඩනැගී තිබූ ශක්තිමත් බැඳියාව නිසයි. නමුත්, බීරි අලින්ට වීණා වාදනය පසෙක තබා උන්ගේ ඇහැට ඇඟිල්ලෙන් ඇන සත්‍ය පෙන්වා දුන් පාපයෙන් උස් තැන්වල සිට ඔහු වෙත එල්ල වූ රුවුම් ගෙරවුම් ද අපමණ ය.

"මං දවසක් අනුරාධපුරේ බස් සේවෙ ගැන පිලේ පැදුරෙං කතා කෙරුව. පහුවෙනිදා අපේ ළමයි බස් එකට නග්ගගෙන නෑ "මං කිව්ව ඇත්ත කියන්ඩ ගියාම ඔහොම තමයි. ඉස්කෝලෙ පයින් පලයල්ල කියල..."

මේ, ස්වර්ණ ශ්‍රී බණ්ඩාරයන්ගේ ම මුවින් ගිලිහුණු වදන් පෙළකි. අප්‍රකටව යටින් එල්ල වූ තර්ජන කෙරෙහි වඩාත් සදය අනුකම්පාවකින් මෙන්ම උපේක්ෂා සහගතව සිනාසුණු ඔහු තවදුරටත් සිය ස්වාධීනත්වය රැකගත් සැබෑ මිනිසෙක් විය. වසරක් ගෙවුණු සඳ "පිලේ පැදුරට" රජරට ජනතාව කොතරම් ආසක්ත වූයේ ද යත්, වරක් කරුණාරත්න ජයතිලක නම් සහෘදයා ස්වර්ණ ශ්‍රී ට ලියා එවූ මේ සතර පද සටහන මොනවට දෙස් දෙයි.

"උස් තැන් වල කකුල් වනන ආයිබෝලංට ඇහෙන්ඩ
වත්තිකරේ ඉන්න අපේ ඇත්තංගේ දුක කියන්ඩ
ගමේ සුවඳ ගව් ගණනක් අහස් කුසේ විසුරුවන්ඩ
අසූ හතර අවුරුද්දෙත් "පිලේ පැදුර" එලාගන්ඩ[2]

එතෙක් කල් අගනුවර දී ලොකු ලොක්කන්ගේ බෙර පදවලට පන්දම් පාලි නැටූ ගුවන්විදුලිය, හද්දා වත්තිකරේ හව්හරණක් නැති අයට ලෙංගතු වූයේ එතැන් පටන් ය.

සාර්ථක සන්නිවේදකයා නිබඳ පය ගසා සිටිනුයේ පොදු ජනතාවට අයත් පොළෝ තලයෙහි ය. ඔහු ආශ්වාස ප්‍රශ්වාස කරනුයේ පොදු ජනතාවට අයත් වායු ස්කන්ධයයි. එහෙයින් ම, ඔහුගේ හෘද ස්පන්දනයෙහි රිද්මය ද පොදු ජන දුක සැප අනුව උස් පහත් වෙයි. පොදු

ජන සහෘදයා හා සැබෑ සන්නිවේදකයා අතර පැවතිය යුතු මෙකී සහසම්බන්ධතාව වඩාත් ප්‍රශස්ත තලයකට සංක්‍රමණය කරනුයේත් ඔවුනොවුන් අතර හුවමාරු කෙරෙනුයේත් බැවහැර භාෂා මහිමයෙනි. මනෝ විද්‍යාව හා සන්නිවේදනය පිළිබඳ ලිපියක් ලියන ජෝර්ජ් ඒ. මිලර්[3] (Jeorge A miller) ප්‍රකාශ කළේ මිනිස් සිත හා එහි ගැටලු හඳුනාගන්නටත්, ඊට නිසි විසඳුම් යෝජනා කරන්නටත් සැබෑ සන්නිවේදකයා පළමුවෙන් ම පොදු ජන බස හඳුනාගත යුතු බවයි.

ස්වර්ණ ශ්‍රී සිය මනැස හා මසැස යොමු කළ සකලවිධ නිර්මාණ ක්ෂේත්‍රයන් තුළ මෙකී විශිෂ්ටත්වය මැනැවින් කැපී පෙනිණි. සාර්ථක සන්නිවේදන කාර්යයක ඉෂ්ට ඵල ඔහු නෙලා ගත්තේ ඒ මහිමයෙන් ම යැයි කීම අතිශයෝක්තියක් නොවේ. හුදෙක් රසාස්වාදය ම පමණක් අරමුණු කොට ගත්, බොළඳ ඉන්ද්‍රජාලමය ක්‍රියාකාරිත්වයන් හමුවේ ඔහුගේ හඬ දවැන්තව නැගී සිටියේ එබැවිනි. කොළඹ සිට හීනෙන් ගම දකින ගුවන්විදුලි මාධ්‍යකරුවන්ගේ හැටියට ස්වර්ණ ශ්‍රී බණ්ඩාරයන් ගැමි දැනුම් කෝෂ්ඨාගාරයකි. එවක ප්‍රාදේශීය ගුවන්විදුලිය රජරට ජනතාවගේ සිත් තුළට සේන්දු වීමෙහිලා ස්වර්ණ ශ්‍රී ගෙන් ලැබූ දායකත්වය කෙබඳු වී ද ? රජරට සේවයට දහතුන් වසරක් පිරෙන දා පළ කෙරුණු සමරු සටහන් කිහිපයක් ඒ සඳහා සාක්ෂි කොට දක්වමු.

'ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාවක් වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම පොදු ජනතාවට සමීප, ඔවුන්ගේ දුක සුසුම හා සතුට මුසු වූ එකක් මෙන්ම විවිධ තොරතුරු සහ පණිවුඩ මගින් ඔවුන් දැනුවත් කරන ජනමාධ්‍ය ආයතනයක් ද විය යුතුය, යන්න මගේ අදහසයි. එය කොළඹ ගුවන් විදුලියේ ම ආකෘතියක් විය යුතු නොවේ. අසන්නන් හා දෙඩිය යුත්තේ ඔහුගේ ම පිලේ සිට ඔහුගේ ම ගොවි බිමේ සිට කතා කරන ලෙන්ගතු ලීලාවෙනි. රජරට ජනවහර පිළිබඳ මනා වැටහීමක් තිබූ ස්වර්ණ ශ්‍රී ගේ වැඩසටහන් එදා ඉතා ජනප්‍රිය වුයේ මේ රහස ඔහු හොඳින් අවබෝධ කොටගෙන තිබූ බැවිනි. අද එවැනි වැඩසටහන් නැත්තේ එවැනි 'දැනුමැත්තන්' අප අතර නොමැතිකම නිසා ද?[4]

ස්වර්ණ ශ්‍රී මේ රහස දැන සිටියේ ය. එතකුදු නොව, ඔහු ලැබූ විෂයාවබෝධය ප්‍රායෝගික භාවිතයන් තුළින් පර්යේෂණාත්මකව අත්හදා බලා පසක් කොට ගත්තේ ය. හුදෙක් පොතපත පරිශීලනයෙන් තමන් දායාදකොටගත් විවිධ විෂයාවබෝධයන් ස්වකීය ජීවිතය හා වෛන්ද්‍රියව බද්ධකොට ගැනෙන්නේ එවිට බව ඔහු දැන සිටියේ ය. අනතුරුව, තමා ලබාගත් ජීවිත පරිඥානයෙන් යුතුව සෙසු සමාජ කොටස් කෙරෙහි යහපත් සන්නිවේදනාර්ථ පතළ කිරීම ඔහුට වඩාත් පහසු විය. සාර්ථක සන්නිවේදකයා හැමවිටම සිය කාර්යභාරය ඉටුකිරීමෙහි ලා පාදක කොටගන්නා විද්‍යාත්මක ක්‍රමෝපායයන් ඔහු පසක් කොට ගෙන තිබිණි. ගැමි ජන සමාජ සංවර්ධන ක්‍රියාපිළිවෙලක දී වඩාත් අගය කළ යුතු පෙරදිග සංවර්ධන නියායන් හි ආලෝකය ඔහුට ලැබුනේ එබැවිනි.

'ප්‍රජා සංවර්ධනය සඳහා ප්‍රාදේශීය ගුවන්විදුලිය' (Regional Broadcasting for Rural Develop.nent) තේමා කොටගෙන 1979 මැලේසියාවේ ක්වාලාලම්පූර් හිදී පැවැත්වූ සංවර්ධන සන්නිවේදන වැඩමුළුවට සහභාගි වූ ඔහු ආසියාවට නව ගුවන් විදුලි වැඩසටහන් හඳුන්වාදෙන්නට යෝජනා හා ව්‍යාපෘති සකස් කළේ ය. ඒ ඔහු ලැබූ ගැමි ජන ජීවන පරිඥානයේ

මහිමයෙනි. කටින් කී දේ ඔහු අතැඹුලක් සේ දන සිටියේ එය සිය ජීවන අත්දැකීමක් කොට ගැනුණු බැවිනි. අද මාධ්‍යවේදීන් ලෙස හුදෙක් ලේබල් අටවාගත් සමහරුන්, තමන් කරන කියන දේත් නොදන්නේ ඔවුන් අඳුරේ අතපතගාන්නන් වන බැවිනි. නමුත්, ස්වර්ණ ශ්‍රී ඒ අතර අපට දිස්වන්නේ දවැන්ත පහන් ටැඹක් ලෙසිනි.

එවක රජරටට යාබදව සොකරියක්, කෝළමක්, බලියක්, තොවිලයක්, කංකාරියක්, කයියක්, අත්තමක් වී නම් ඔහු එය දන සිටියේ ය. රජරට ඔහු පය නොගැසූ ඉසව්වක් සොයා ගැනීම දුෂ්කර විය. හේනක්, කුඹුරක්, කමතක්, ඔිවිටක්, බඩවැටියක්, වැ පිටියක්, වනාතක්, ලන්දක් ඔහුට අරුමයක් නොවූයේ එබැවිනි. එකී සරල සැහැල්ලු ගැමි දිවිපෙවෙත කෙරෙහි ඔහු දක් වූ රුචිය හෙළි කළේ කවියක රසය ඊට කැටි කරමිනි. 'ගැමිදිවිය හා වප්මඟුල' නම් පර්යේෂණාත්මක ලිපි සංග්‍රහය තුළින් එකී රසයත්, ඥානයත් එක්තැන් කළ ඔහු මියැදෙන ශ්‍රේෂ්ඨ සංස්කෘතියකට නව ජීවය පිඹින්නට වලිකෑවේ ය. එය, තත්කාලීන ගොවි සමාජයෙන් ක්‍රමයෙන් ඈත්වෙමින් පවත්නා 'නගුල' පිළිබඳවත්, පුරාණ සංස්කෘතියෙහි මඟුල් ලකුණ රැගත් 'වප්මඟුල' පිළිබඳවත් ශාස්ත්‍රීය හැඳුනුම්පතක් බඳු විය. ගමේ ගොඩේ වෙල්යාය වගේ ම චිරන්ත සාහිත්‍යය ද එහිදී ඔහුගේ පර්යේෂණාගාර බවට පත්කොට ගැනිණි.

'ඈත අතීතයෙහි අපේ ගොවිතැන් බතෙහි කටයුතු එකම රටාවකට සිදුව ඇති වග එකල ලියැවුණු අපේ සාහිත්‍ය කෘති තුනක් හැදෑරීමෙන් පෙනේ. මේ කෘතීන් තුන නම්, **සද්ධර්මරත්නාවලිය**, **පූජාවලිය** හා **පන්සිය පනස් ජාතක පොතත්** ය. මේ පොත් අතරින් **පූජාවලිය** වන අත් ගැසීමෙහි සිට අස්වනු නෙලා කොටු වල ලෑම දක්වා වී වගාවේ සියලු විස්තර කිසිවක් නො අඩුව පියවරෙන් පියවර දක්වා ඇත. **පන්සිය පනස් ජාතක පොතෙහි** බන්ධභාල ජාතක කථාවෙහි දක්වෙන කමත් විස්තරය අනෙක් දෙපොතෙහි ඇති අඩුපාඩුව මකාලයි. පොත් තුනෙහි ම එන විස්තරයන් ගලපාගත් කල ඈත අතීතයෙහි ගොවිතැන් බත පිළිබඳ මනා විස්තරයක් සපයා ගත හැකි වෙයි..'[7]

ස්වර්ණ ශ්‍රී මේ සියල්ල සිතැඟි පරිදි හදාළේ ය. පසුව ඔහු ලියූ දේ තුළ ඒ හැදෑරීම් හි ආලෝකය විසිරී තිබෙනු අපට දක්නට ලැබිණි.

'සමහර පළාතක නගුල් දත සෙලැවී නොයාම පිණිස එහි මැදින් සිදුරක් විද වැල්පොටක් ඒ තුළින් යවා නගුලිසේ මුල අසුවන ලෙස තදින් වෙලනු ලබයි. 'එකට සම්බන්ධ කෙරෙන්න යන' අරුත් ඇතිව මෙයට ගැමියෝ 'හමන්නාව' යන නම වහරනු ලබත්, සමහර පෙදසක මෙම සිදුර 'හමන්නා ගුල' ලෙස ද 'හමන්නා හිල' ලෙස ද හඳුන්වනු ලබයි.

සී සෑමෙහි දී පාරවල් එක්තරා රටාවකට ඇඳීමට සැලැස්වීම ගොවියාගේ සිරිත ය. මින් වඩාත් ප්‍රචලිත රටාවෝ නම 'නාමල් දගේ' හා ' නවපොට දගේ' ආදියයි. නාමල් දග රටාව ඉහිරුණු විට ලියද්ද පුරා පිපී විසිරුණු නා මලක ස්වභාවය ද, සපුමල් දගේ ඉහිරුණු විට සපුමලක් පිපී ඉසිරුණු ස්වභාවයක් ද ගන්නේ යැයි පැරැන්නෝ කියති. නවපොට දගේ යෙදා සී සෑම කළ විට ලියද්ද පුරා විසිරුණු හී පාරවල් නවයක් දග කැවීගොස් තිබෙනු දකිත හැක. අද මේ අන්දමට රටා වැටෙන්නට සී සෑමට දන්නෝ විරලයහ. සී සෑමේ දී ලියද්දේ ඉහත්තාවට ගොන් ගෙනයාම 'ඌඩ යාම' ලෙසත්, පහළට යාම 'බහ යාම' ලෙසත් උඩරට ගොවීහු සළකති.

හී පාර පිළිවෙලින් ඌඩියට ගෙනගොස් බහේ යාමට හැරෙන තැනට කියනු ලබන්නේ "නැම්ම" කියා ය. එසේ හැරීම සිදුවන්නේ "නැම්ම ගන්නවා" කියා ය. මේ හැරුනුකොට "තිකමල් දහයක්" ගැන කියතත් ඒ ගැන දන්නෝ ඇත්තේම නැත..."[8]

එදා සහ අද අතර බොහෝ වෙනස්කම් සිදු වී ඇති බව ඔහු හඳුනා ගනී. ඒ පිළිබඳ ඔහු තුළ රෝෂයක් නැත. නමුත්, සියල්ල නොහොබිනා ලෙසිනුත්, අවිචාරවත් ලෙසිනුත් උඩුයටිකුරු වෙමින් පැවතීම කෙරහි ඔහු දක්වූයේ දැඩි කළකිරීමකි. ඔහුගේ කෘතියකින් උපුටා ගත් මෙකී අදහස් ඒ බව මනාව තහවුරු කරයි.

"වප් මගුලට සැරසෙන ගොවියා හිස් සෝදා නා පිරුවට ඇඳ පිරුවට සුම්බරයක් බැඳ කමතෙහි ඇති කිරි ගසක් පේ කර ඒ ළඟ පහන් පැලක් තනා දෙවියන්ට පුදපෙත් දී වැඳ කුඹුරට බැසීම ය සිරිත. ඒ පහන් පැලේ සිට කුඹුරට පිරිත් හුයක් ඇද රෑ තිස් පෑ ගිහිපිරිත් කීමේ සිරිතක්ද පුරාණයේ සමහර පළාතක පැවතිණ."

දැන් ඒ සිරිත ද පෙර කී තොරතුරු ආදියේ නාම මාත්‍රයෙන් ද මියැදී ඇත. ඒ නවීන කෘෂි උපකරණ අපේ ගම්වලට ඒමේ ප්‍රතිඵලය කි. සී සෑමත් සමග ම අපේ කන් තල තුළින් රිංගා සිත් නැලැ වූ අඬහැර හඬ මැකී ගොස් අද අපේ කන'ගුල් පුරවනුයේ අර නවීන උපකරණයෙන් මැවෙන කන්දොස්කිරියාව ය."[9]

රජරට ජනශ්‍රැතිය හා ජනවිඥානය පිළිබඳ අතිශයින් ගැඹුරු වූ විධිමත් පිරියෙසුම් කරන්නටත්, එය සමස්ත සමාජයීය දායාදයක් ලෙස දුහුනනට ප්‍රදානය කරන්නටත් නිහතමානී වූ ඔහු එහි ශාස්ත්‍රීය ප්‍රතිෂ්ඨාව දැඩිව තහවුරු කරන්නට තිබඳ උත්සුක වූ විද්වතෙකි. නුවරකලාවියේ වැව් ගම්මානයන්හි දියවර පතා කෙරෙන "මුට්ටි නැමිල්ල" ගැන කෙරුණු අධ්‍යයනය හා "සංහිඳ" පර්යේෂණ ග්‍රන්ථය ඊට මනා නිදසුන් ය.

ඔහු ඒවාට සපයන ලද අර්ථ නිරුක්තීන් සැබැවින් ම චිරාත් කාලයක සිට පැවැත් වූ නොනිල පර්යේෂණයන්ගේ මහාර්ඝ ප්‍රතිඵල ලෙස ජනශ්‍රැති විශේෂඥයෝ හඳුන්වති. සාම්ප්‍රදායයිකව පැවත එන සමාජ චර්යාවන් කෙරෙහි ලා සිය පර්යේෂණශීලී දෘෂ්ටිය යොමු කරමින් ඔහු විශද කළ "නූතන පුරාතන සමාජ ඥතීත්වය" ජනශ්‍රැති පර්යේෂණයෙහි නව මං හෙළි කරන්නට සමත් විය. උඩරට යක්කම් හා කංකාරි ආශ්‍රිතව ගොඩනැගුණු සංගීත සම්ප්‍රදාය අපේ වැදි නැටුමෙහි ක්‍රම විකාශයට බොහෝ සේ සමීප බවට ඔහු තුළ වූයේ දැඩි විශ්වාසය කි. වැදී සමාජය තුළ ප්‍රචලිතව දක්නට තිබූ "කිරි කොරහෙ නැටුම", "කොල මඩුවෙ යාගය" හා "නෑ යකුන් පිදීම" සම්බන්ධ බොහෝ ක්‍රියාකාරකම් අද ද අප අතර පවතින කංකාරි විශේෂයනට පාදක වී ඇති බව ඔහු හෙළි කළේ එහි සියලු ශාරීරික ඉරියව් හා චලන රිද්මයන් පිළිබඳව කළ ගැඹුරු විශ්ලේෂණයක් තුළිනි.

"මෙහිදී අනුමැතිරාළ තම නැටුම අරඹනුයේ ඉතා සෙමෙන් හා නැවතිල්ලේ ය. ඔහු තම විලුඹ පළමුකොට දෙවිටක් බිමට ඇණ ඉනික්බිති පතුල බිම තබයි. ඒ බිම තැබීමත් සමග ඔහු තම සිරුරු කඳ සමීපයෙන් මඳක් ඉදිරියට නමා හිස ද නමයි. එය බොහෝවිට "මඩේ"

තබා ඇති යහනට කරන ගෞරවාචාරයක් බඳු ය. එමැ සිරුර නැමීමත් සමග ඔහු යළි විලුඹින් පොළොවට අනී. මේ සියලුම පැගීම්හි දී ප්‍රධානත්වය ගනුයේ දකුණු පාදයයි. වම් පාදය ඒ අනුව ක්‍රියාකරවනු පමණි. එක්තරා රිත්මයකට ඔහු විසින් පදවනු ලබන කය වඩවඩාත් වේගයෙන් පැදවීමත් සමග පා සලඹ ද වේගවත් වේ. ඉතික්බිති ඔහු දෙපය ම එක් කර ඉදිරියටත් පස්සටත් පැනීම අරඹයි. ඉදිරියට පැනීමත් සමග ම ඔහු තුනටිය සමීපයෙන් කඳ ඉදිරියට නැමීම ද, පස්සට නැමීමත් සමග කඳ කෙළින් කිරීම ද සිදු කරයි. කඳ ඉදිරියට නැමීමේ දී වඩාත් පොළොව දෙසට නැඹුරුවීම ද, හිස වඩාත් පහත් කිරීම ද අනිවාර්යයයෙන් ම සිදුවේ. කඳ කෙළින් කිරීමේ දී කෙළින් කටින් සිටගන්නා ඔහු හිස පිටිකර නවා අහස දෙස බලයි. ඒ සමගම කටින් හඬක් පිට කිරීම ද වේ.

මේ හා සමග ම පසුබිමෙන් දවුල් තම්මැට්ටම් වාදනයක් නංවන අතර අනුමැතිරාළ හා පැමිණි තවත් කෙනෙක් (ඔහු ද අනුමැතිරාළ කෙනෙකි) කවි ගායනය කරමින් උඩැක්කි වාදනය කරයි. එමැ ගායනයන් සෑමෙකක් ම පාහේ කෝල්මුර කවි ය.

එබඳු කාරණා කාරණා අදත් අප අතර ශේෂව පවතින්නට ඔහුගේ පරිශ්‍රමයන් ද හේතු විය. ස්වකීය හාත්පස ශ්‍රාවකයා ආනන්දයෙන් ප්‍රඥාව කරා මෙහෙයවන්නට තිබඳ දුෂ්කර ව්‍යායාමයන් හි යෙදුණු ඔහු සකස් කළ "නිර්මාණ" "සංහිඳ" හා "සම්භාෂා" වැනි වැඩසටහන් අද්‍යතන ගුවන්විදුලි මාධ්‍ය මෙහෙවරෙහි අග්‍රඵලයන් ලෙස සනිටුහන් වෙයි. හුදෙක් දුහුනන් දනුම් සඳහා ම "නිර්මාණ" මෙහෙයැ වූ ඔහු රජරට පුරා විසිරී පැතිරී සිටින තුරුණු පෙළට කවි, ගී රසවිඳුමත්, නිමැවුම්කරණය මෙන්ම හැබෑ විචාරය ද අත්පොත් කරවීමට පුරෝගාමී විය. රජරට සේවාව නාමයෙන් බිහිව අද කලා ලොව අබිසෙස් ලැබ සිටින සමස්ත නිර්මාණ ශිල්පී සමූහයාගේ දිගු නාමාවලිය ම ඊට දෙස් දෙයි. නොදත් දේ දැනගන්නටත්, දත් දේ වඩාත් සැක හැර තහවුරු කරගන්නටත් මග පෑදූ ඔහුගේ "සම්භාෂා" වැඩසටහන ද සැබැවින් ම දනුම හා ලබැඳියාව එක්ව මුසුකොටගත් සෞන්දර්ය ප්‍රභාෂණයක් ම විය.

ඒ හැර, සුභාවිත ගීත සාහිත්‍යයක් කෙරෙහිලා ඔහුගේ දායකත්වය සැබැවින් ම ස්වර්ණමය සිහිවටන සහිත ය. කව්ලැකිය හා පුරවහර මෙන්ම ගම්වහර ද මනා කොට දත් ඔහු අතින් නිමැවුනු කවි, ගී ගණනින් අතලොස්සක් නොවේ. ඒ බොහෝ පදවැල් තුළ කැටි කොට තිබුණු "අපේකම" ආයාසයෙන් එබ්බවූවක් යැයි අභියෝග කරන්නට කිසිවෙකුට හෝ නොහැකිය. තමන් ඇසූ, දුටු, අත්විඳි සකලවිධ ජීවන ප්‍රවෘත්තීන් පොදු මානවීය දෘෂ්ටියට හසු කරවන්නට ඔහු ගත් උත්සාහය විශද කෙරෙනුයේ එකී ගී පදවැල් ස්වල්පයක්වත් හුදෙක් නාමමාත්‍රිකව හෝ සිහිපත් කිරීමෙනි.

"ආශා දෑසින් දකිනා සිහිනේ" (දේවානන්ද වෛද්‍යසේකර)

"දෑතේ එල්ලී මියුරු කතා කී" (විශාරද අමරදේව)

"අභිධාන යශෝකඳ" (විශාරද අමරදේව/ නීලා වික්‍රමසිංහ)

"නුරා වඩන රුබර අහනෝ" (විශාරද අමරදේව/ නීලා වික්‍රමසිංහ)

"නොසිතූ කලෙක වැහි" (විශාරද අමරදේව)

"ඔබේ දෑස් තෙහෙලි පොතේ" (විශාරද අමරදේව)

"සරා සළෙල දන සතොසේ" (විශාරද අමරදේව)

සරා ගී නුවන් අංජන" (විශාරද අමරදේව)

"මගෙ හද මඬල මල් යහනකි" (විශාරද ගුණදාස කපුගේ)

"ඔබ රූ සිරියෙන් " (එඩ්වඩ් ජයකොඩි)

"වැහිපොද වැටිලා බිම් මල් පිපිලා" (නීලා වික්‍රමසිංහ)

"රන්කම් ලියකම්" (නීලා වික්‍රමසිංහ)

"නව්ව ගීත වාදිතයෙන්" (සනත් නන්දසිරි)

"පොත් ගුල ඇතුළේ" (බන්දුල විජේවීර)

"සෙල්කුලේ මහා කලා නිකේතන" (බන්දුල විජේවීර)

"ඉන්ද්‍ර නීල නෙතු සහලා" (බන්දුල විජේවීර)

"නිසල අඳුරු පාළු රැයේ" (බන්දුල විජේවීර)

"නුඹ හැර දා සිදදියට" (දයාරත්න රණතුංග)

"දසනිල්ල මැකී" (මාලනී බුලත්සිංහල)

"පුතුනි ඔබව" (විශාරද අමරා රණතුංග)

"ඔබෙ නුවන් කැලුම්" (රෝහණ වීරසිංහ)

"දෑතින් දෙපිලට" (කුමුදුනී ගුණවර්ධන)

"අයියන්ඩි" (කුසුම් හේරත්")

යන ගී පබැඳුම් ඉන් ස්වල්පයක් පමණි.

අපේ මුල් කාලීන ගීත සාහිත්‍යයෙහි පද යෙදුම්, උපමාලංකාර හා වාග් ව්‍යවහාරයන් විසින් අපේ සාම්ප්‍රදායයික වහර හා භාෂා ප්‍රයෝගයන් ද ඉක්මවීම දුබලතාවක් ලෙස ඔහු පෙන්වා දෙයි. ස්වාධීන සංගීත පද්ධතියක් හා අත්වැල් බැඳගත් ප්‍රබල ගීත සාහිත්‍යයක් නොතිබීම ඊට මූලික හේතුව යැයි ඔහු දැඩිව විශ්වාස කළේය. එයින් නොනැවතී, එබඳු ප්‍රබල ගීත සාහිත්‍යයක් හදා වඩා පෝෂණය කරගැනීමෙහි ලා වඩාත් ඉවහල් කරගත යුත්තේ කුමන විෂය ක්ෂේත්‍රයක්දැයි ඔහු වහ වහා පෙන්වා දෙයි.

"...අප විසින් අපේ සංගීත රටාවන්ට උචිත ප්‍රබල ගීත සාහිත්‍යයක් සඳහා ද පර්යේෂණ පැවැත්විය යුතු වෙමු. නව යෙදුම්. උපමා උපමේය ආදියෙන් පිරිපුන් ප්‍රබල ගීත සාහිත්‍යයකට සුදුසු අමුද්‍රව්‍ය අද ද නොනැසී පවත්නේ අපේ ජනශ්‍රැති සාහිත්‍ය තුළයි...[11]

නූතන කවි කෙත සරු කරවීමෙහි ලා ඔහු වැපිරූ බිජුවට සුහුඹුල් දළුලා වැඩෙනු දක්නට වරම් නො ලද ස්වර්ණ ශ්‍රී බණ්ඩාරයන්, කවියකු හැටියට සම්මතය අබිභවා මිනිස් ප්‍රජාවේ විමුක්තියත්, විභූතියත් කෙරෙහි ලා සිය කවිකම කැප කළ බව විශද කළේ ය. මානවීය චින්තනය ම අධ්‍යාත්ම කොටගත් ප්‍රතිභානයෙන් ඔහු දුටු සමාජ සත්තාව ¨ සකි සඳ බලව ¨යි අපට පසක් කළේය.

¨තනේ නොමැති කිරි
පුතුට කොයින් දෝ
කඩ පිල් වල
ටින් පතුලෙ තියේ දෝ

පාණ්ඩුවෙන් ලේ හිඳිලා
කිරි දරු බඩ හැකිළීලා
රාක්කයට කිරි එරිලා
මුදලාලිගෙ බඩ පිරිලා

තනය කපා බිම ගසලා
කඩ පිල් සමතල කරන්ට
පෝලිම විසුරුවාලන්ට
සත් රුවනින් උතුරා යන
කිරි වරුසා වස්සවන්ට
පත්තිනි නෑ
පාලඟ නෑ...

සෑම මානවවාදී පියකුම
ලඟී මව වෙනුවෙන්
ගජසා පෝලිමේ
සොයා යයි මව විදේශ විනිමය
විකුණා ඇඟ මස
ෂයිලොක්වරු... හැම අහලෙම
උදේ ගියපු අප්පුච්චා
තනි යහනේ ගොරවනවා
හඩු ගඳ සරමට රිංගා
හීන දකිනවා...[12]

"මනහර නා මෙනෙවිය හිඳ ල වැලි පිට
ගෙන "මිණි වෙණ තත් තියගින් මැද රුවට
කතා කරයි විනෝදයට
කුස ගින්දර නිවාගන්ට...." **(සකිසඳ බලව පි. 25)**

අපේ සංස්කෘතියේ වල් වැදීමත් සමාජ, සාරධර්ම හා පුරුෂාර්ථයන් හි නාය යාමත් සදය උපහාසයට ලක් කළ ඔහු එය පොදු ජන විඥානයට හසු කරවනුයේ වඩාත් සියුම් ක්‍රම රටාවකට ය.

"සන්ඩෙ කුකරි ක්ලාස් එකක්
සබ්ජෙක්ට් එක කොණ්ඩ කැවුම
කොණ්ඩ කැවුම කොළඹට එන විට පේ වී
කොළඹින් ගමට එයි කොළ කැඳ පෙළපාලි

කොළඹ හිටන් නා තම්දෙන නා නා
කොළඹ හිටන් නා තම්දෙන නා නා

කොළඹ හිටන් ගත්ත්‍රිස්ඤං ත්‍රිස්ඤං
ගතිහ තිහො ඩිංගිරි මැණිකෝ..."

(සකිසඳ බලව" පි. 21)

අයුක්තිය, අසාධාරණය හා සමාජ විසමතාව දඩි ලෙස පිළිකුල් කළ එබඳු තැන් වල දී හුදු සෞන්දර්යාත්මක ප්‍රභාෂණය වෙනුවට එල්ල කළ නිර්දය අතුල් පහර වඩාත් ප්‍රබල විය. පොදු මානව හැඟීමෙන් යුතුව ඔහු සිත තුළ කැකැරුණු වෛරය සන්සිඳෙනුයේ ඔහු කුස පිරීමෙන් නොව, උන් සුන්නද්දූලි කළ කල්හි ය.

"බඩ සා දුක නිවාගන්නට
කුරගාමු ද නිවටුන් දෙපා මුල
උලා නෙක පාට
පොහවා සහජාතියේ උන්
නොයෙකුත් පාට බඳුනෙහි
ගයමු ද තවත් ප්‍රශස්ති...?

කපමු වලවල්
හිර කරමු දඩු මුගුරු
මහ රුක් කඳන්
උන් යන පාර හරහා...
අදින්නට දෙමු ද දෙපිළට ලණුවක්

නැතහොත් උන් අතින්
උන් ගෙලෙහි ලා තලු මරන්නට
දෙමු ද දිරා ගිය කඹයක්

අතගාමු ඒකිනෙකා ගේ ගෙල
සියුම් සැත්කම් තලයෙන්
ආදරයෙන්... ස්නේහයෙන්
පාන් ගෙඩියක් පෙති ගැසෙන සේ
කැපේ නම් උන්ගේ ගෙල
පිරේ මා කුස
පිනවා මුළු සිරුර..."

(**සකිසඳ බලව** පිටු. 43, 44)

අතැඹුලක් සේ ඇස්පනාපිට පෙනෙන මෙකී සත්‍යය හුදු ව්‍යාජයක් බවට හරවන්නට කැසකවන ඊනියා මාධ්‍යකරුවන්ගේ නූතන රාජකාරිය ඔහු විග්‍රහ කරනුයේ කෙලෙසක ද?

"ලෝබ බැඳ කේජු කැබැල්ලකට
ගයත් ප්‍රශස්ති ගීතිකා
වඳුරන් පිට තියා යන කිඹුලන්...."

("**සකිසඳ බලව**" පිටු. 44)

මේ අයුරින් වඩාත් පුළුල් වූත්, වඩාත් සංකීර්ණ වූත් මානව අන්තර් ක්‍රියාවලියක් වූ සන්නිවේදන කාර්යයෙහි[13] විවිධ පැතිකඩ ඔස්සේ සහෘදයාට සමීපවන්නට තිබඳ ඔහු උත්සුක විය. බී. බී. සී. ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වර ජෝන් රීත් සාමිවරයා ප්‍රකාශ කළ පරිදි "ලෝකයෙන් ඉගෙන, ලෝකයට උගන්වන්නා සැබෑ සන්නිවේදකයා [14] ය." සිය අසල්වැසියා මෝහනයෙන් මුදවා ප්‍රඥාලෝකය කරා රැගෙන යන්නට ඔහුට හැකි වෙයි. ස්වර්ණ ශ්‍රී බණ්ඩාර නම් සන්නිවේදකයා ඒකී සමාජ නියාමකත්වයෙහි පෙර ගමන් හෙබවූ බව අතිශයෝක්තියක් නොවේ. "නම පළ වෙනු එකකි. පල් වෙනු එකකි." යන ආප්තෝපදේශය ගුරුතන්හි ලා සලකමින්, කිව යුක්ත හරිහැටි කියන්නටත්, කළ යුත්ත හරිහැටි කරන්නටත් මාධ්‍ය උපයෝගී කොට ගත් දුලබ ගණයේ විද්වත්වරයෙකි, ඔහු.

සංහිතා ධ්වනිය (ආයුර්වේද සාහිත්‍ය පිළිබඳ ලිපි සමුච්චය) **සල්මල්** (ළමා ගී) **අල්මේදලා බෝල ගසති** (කෙටිකතා) **පරපුටුවෝ** (විකාරරූපී නාට්‍ය) **කැඳැල්ලේ කුරුල්ලෝ** (යොවුන් නවකතාව) **දොල පිදේනි** (පරිවර්තන) **සුදු මුතු කුඩ යට** (ගී පදමාලා) **සංහිඳ** (ජනශ්‍රැති පර්යේෂණ) යන කෘතීන් තුළින් ද විශද කෙරෙනුයේ ඒ දනුම් කෝෂ්ඨාගාරයේ දිග පළල වපසරියයි. පොදු මිනිස් සමාජයේ සුගතිය අපේක්ෂා කළ සැබෑ සන්නිවේදකයකුගේ සුපැහැදිලි පිළිබිඹුවයි.

සටහන්

01. *"Epistula ad Pisonei" හෙවත් "Ars Poetica" (සාහිත්‍යකරණ කලාව)* ˙Horace, Publiction, Rome, 1960, p. 17.

02. බණ්ඩාර, ස්වර්ණ ශ්‍රී, ˙ආයුබෝවන්˙ (සංස්කරණයක්).
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, රජරට සේවය, අනුරාධපුර, 1984, පිටුව 43.

03. Miller, Jeoge A, - *Psychology and Communication (Article Series)* Voice of America Forum Series, 1974, p, 6.

04. ගුණසේකර, නිව්ටන්, ˙රජරට සේවය˙ (සංස්කරණයක්).
˙වසර දහතුනක මතක සුවඳින් බිඳක්˙ ශ්‍රී ලංකා ගු. වි. සං. ර. සේ, අනුරාධපුර, 1992 මැයි,

05. ඉහත සභරාව, සිරිපාල රදම්පලගමගේ (මගේ මතක සටහන්) ලිපිය.

06. McRoy, Jeorge, *Broadcasting and the Voice,* The Handbook for the Broadcaster, Peacock Publishers, New Jersey, 1971, p. 42.

07. බණ්ඩාර, ස්වර්ණ ශ්‍රී, *ගැමිදිවිය හා වප්මගුල, ගැමි සේවා සෙවණ,* ගලහ, 1982, පිටුව 5.

08. ඉහත කෘතිය, 15, 16 පිටුව.

09. එම. 18 පිටුව.

10. බණ්ඩාර, ස්වර්ණ ශ්‍රී, ˙ජනශ්‍රැති හා ගීත සාහිත්‍යය˙ ලිපිය අමරදේව ප්‍රතිසංවේදය (ප්‍රනීත් අභයසුන්දර/ අමරකීර්ති පලිහපිටිය/ අමරසේකර හෙට්ටිආරච්චි සංස්කරණය) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 1983, 71-72 පිටු.

11. ඉහත ලිපිය, 79 පිටුව.

12. බණ්ඩාර, ස්වර්ණ ශ්‍රී, සකිසඳ බලව, සුජල ප්‍රකාශකයෝ, අනුරාධපුර, 1989, 19-20 පිටුව.

13. වැඩි විස්තර සඳහා බලන්න. Jeorge Garbner, *Mass Media and Theory of Human Communication* pp. 35-54. Denis McQuail (ed) *Sociology of Mass Communication,* Penguin Books, London, 1972.

14. Reath, John, *The Future of Broadcasting* (A Report Presented to the Social Morality Council, London, 1972.